# ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව- 2024

**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය**

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ආයතනයේ නම: ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය: 309

පටුන


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය ................ 2

1.1 හැඳින්වීම ................ 2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ................ 8

1.3 ප්‍රධාන කාර්යයන් ................ 10

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ.......... ................ 11

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන /අරමුදල් ................ 12

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම ................ 13

2.1 2024 දක්වා අතීත කාර්ය සාධනය ................ 13

2.2 2024 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය ................ 15

2.3 උපදේශක අංශයේ කාර්ය සාධනය ................ 17

2.4 සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම ................ 18

පරිච්ඡේදය 03-2024 දෙසැම්බර් 31දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........19

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ................ 19

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ................ 20

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ................ 21

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ................ 22

1.වාර්තාකරණ කාල පරිච්ඡේදය... ................ 22
2.මිනුම්කරණ පදනම ................ 22
3.ආදායම් හඳුනා ගැනීම ................ 22
4.දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම ................ 22
5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය ................ 22
6.මුදල් හා මුදල් සමාන දෑ ................ 22

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ................ 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ................ 23

3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ................ 24

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ................ 25

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව** ................ 26

පරිච්ඡේදය 04— කාර්ය සාධන දර්ශක ................ 39

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය ................ 40

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ ................ 41

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ................ 41

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න ................ 41

6.3 මානව සම්පත් කළමනාකරණය ................ 42

පරිච්ඡේදය 07— අනුකූලතා වාර්තාව ................ 45

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 කට වැඩි කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි .ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකතනය කරයි.

### විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වගකියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක *5* කට වැඩි කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය අර්ථ කථනය කරගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම, ශ්‍රම බලකාය අධීක්ෂණය, පාලනය සහ සමාලෝචනය, අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම , කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ ඉංජිනේරුවරුන්, සේවාදායකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට මෙම වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතී. කලාප *7* තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපාති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම් වල සහ ප්‍රාග්ධන වියදම් වල සාරාංශය මඟින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම් පිරිවැය ඵලදායි වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයන්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබා දෙයි. උපරිම කාර්යක්ෂමතාවයක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරනු ලැබේ.

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු කිරීම්වලට අදාල සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

## අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

2024 මූල්‍ය වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුලින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුව සමත් විය.

රටෙහි පැවති ආර්ථික අභියෝග හමුවේ හා රජයේ අයවැය යටතේ සීමිත යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන ප්‍රතිපත්ති හමුවේද 2024 වසර තුළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 80% කි.

2024 වසරේදී, අපි අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් හරහා කාරය මණ්ඩල සංර්ධනය කරගෙන ගියෙමු. තවද, විශ්වවිද්‍යාල හා අනෙකුත් තාක්ෂණික ආයතනවල සිසුන් සඳහා කාර්මික පුහුණු අවස්ථා ලබා දුනෙමු.

### 2024 වසර තුළ මුහුණ දුන් බාධකයන්

- කාර්ය මණ්ඩලයේ හිඟකම ඉංජිනේරුවන්,  කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්, තාක්ෂණ සහායකයින් හා රියදුරන්ගේ හිඟකම.
- පහසුකම් සහ ප්‍රතිලාභ මද හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම, රජයේ නිලධාරීන් සඳහා වන වැටුප් රහිත නිවාඩු චක්‍රලේඛය අනුව විදෙස්ගත වීම නිසාවෙන් සේවක සංඛ්‍යාව අඩු වීම.
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන හිගකම.
- හදිසි ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම මත වැඩබිම් කාර්ය මණ්ඩල ලබා ගැනීමේ අනුමැතිය නොමැති වීම.
- සංචාරක බංගලා නඩත්තුව/ නගාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා කලමනාකරණ ගාස්තු දෙපාර්තමේන්තුව වෙත නොගෙවීම (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු).
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම.
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත්  මදකම නිසා හා ප්‍රතිපාදන නොමැතිවීම මත කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව.
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්.

**බාධක ජය ගැනීමට යොදන ලද උපක්‍රම**

- අදාළ බලධාරීන් විසින් පුරප්පාඩු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
- පවතින කාර්ය මණ්ඩලයෙන් රාජකාරී ආවරණ හා වැඩ බැලීම් පදනම යටතේ රාජකාරී කටයුතු කරගෙන යාමට පියවර ගෙන ඇත.

**ඉංජි.කේ.ජී.එස් කුමුදිනි**

**ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්**

# කළමනාකාරීත්ව - ධූරාවලිය

| | |
|---|---|
| **ඉංජි.කේ.ජී.සන්ධ්‍යා කුමුදිනී මහත්මිය** | අධ්‍යක්ෂ ජනරාල් |
| **ඉංජි.ජී.එච්.හිරිමුතුගොඩ මහත්මිය** | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) |
| **වාස්තු විද්‍යාඥ කේ.බී. මේනක මංගලනාථ මහතා** | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා) |
| **ඉංජි .ඒ.එම්. වික්‍රමසිංහ මහතා** | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1) |
| **ඉංජි ජී.ආර්.එස්.බී.ගම්ලත් මහතා** | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 2) |
| **ඉංජි.එස්.එස්.රන්වත්ත මහතා** | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3) |
| **ඉංජි.එච්.එම්.ආර්.බණ්ඩාර මහතා** | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන) |
| **ඉංජි.ජී.එච්.ඒ.බී.සජෝත මහතා** | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ) |
| **ඉංජි .ඊ.ඩී.එම්.එස්.ගුණරත්න මහත්මිය** | අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික) |
| **එස්.ඩී.ඩී.පී. සිංහපුර මහත්මිය** | අධ්‍යක්ෂ (පාලන) |
| **කේ. කේ.අනිල් කන්නන්ගර මහතා** | ප්‍රධාන ගණකාධිකාරී |
| **කේ.ජී.බී. ප්‍රියන්ත මහතා** | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **වාස්තු විද්‍යාඥ ආර්.ඒ.ටී.එස්.රණතුංග මහත්මිය** | අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) |

## සංස්ථානික තොරතුරු

| | | |
|---|---|---|
| **නම** | - | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| **නෛතික තත්ත්වය** | - | පූර්ණ රාජ්‍ය ආයතනයකි |
| **අමාත්‍යාංශය** | - | නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය |
| **ප්‍රධාන කාර්යාලය** | - | දෙවන මහල<br>"සෙත්සිරිපාය", බත්තරමුල්ල ශ්‍රී ලංකාව<br>දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771<br>විද්‍යුත් තැපෑල info@buildingsdept.gov.lk<br>අන්තර්ජාල ලිපිනය www.buildings.gov.lk |




*රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම*

## කලාප කාර්යාල

| කලාප කාර්යාලය | ලිපිනය |
|---|---|
| කලාප 1 (බස්නාහිර උතුර) | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1- බස්නාහිර උතුර) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>නො. 213,<br>ටොරින්ටන් පෙදෙස,<br>කොළඹ 07 |
| කලාප 1 (බස්නාහිර දකුණ) | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1- බස්නාහිර දකුණ) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>නො. 213,<br>ටොරින්ටන් පෙදෙස,<br>කොළඹ 07 |
| කලාප 2 | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 2) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>වෙරළ පාර,<br>ගුරුනගර්,<br>යාපනය |
| කලාප 3 | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 3) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>විල්ගොඩ පාර,<br>කුරුණෑගල |
| කලාප 4 | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 4) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>පනිච්චායඩි,<br>තිරෙමඩු,<br>මඩකලපුව |
| කලාප 5 | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 5) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>තැපැල් පෙට්ටිය 113,<br>මහනුවර |
| කලාප 6 | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 6) ,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>නො.10,<br>ඉහල ඩික්සන් මාවත,<br>ගාල්ල. |

# MAP OF ZONAL OFFICES




*රූපය 2: කලාප බෙදීමේ සිතියම*

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද , තිරිසාර හා විශිෂ්ඨ ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්ෂණයේ පුමුඛයා බවට පත් වීම.

**මෙහෙවර**

තාක්ෂණික වගකීම, ගුණාත්මකභාවය, පිරිමැසුම්දායක බව, අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරිම උදෙසා විවිධ වෘත්තීන්හි නිපුණ, එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම.

**අරමුණු**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා විශිෂ්ඨ සේවයක් සැපයීමට වගකිව යුතු මූලික රාජ්‍ය ආයතනය ලෙස;

- සේවාදායක අවශ්‍යතාවය සපුරමින් ඔවුන් තෘප්තිමත් කිරීම.
- ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතාවයන් සහ අදාල සම්මතයන්ට අනුගත වීම.
- පසුවිපරම් කිරීම ප්‍රතිපෝෂණයන් හා දැනුම් හැකියාව යාවත්කාලීන කිරීම තුලින් අපගේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමෙහිලා නිරන්තර යොමු කිරීම.
- විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයන්ගේ ගැලපීම තුලින් සම්පූර්ණ දායකත්වය ලබාදීම.

**දෙපාර්තමේන්තුවේ සහතිකය**

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලැබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුලින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

1. යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම
2. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්
3. සියලුම රීති රෙගුලාසි සහ තත්ත්ව හා ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය කිරීම
4. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය
5. අනෙකුත් සේවා සපයන්නන්ගෙන් සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම
6. කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම
7. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය මඟින් වටිනාකම් සහතික කර දීම
8. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම
9. ගිවිසුම්ගත නීතිමය කටයුතුවලදී සහය ලබාදීම
10. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගී වී තාක්ෂණික සහය ලබාදීම
11. ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා ගොඩනැගිලි සඳහා මිල ගණන් සාරාංශ (BSR) සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

# සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවාදායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති වෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

**ව්‍යාපෘති යෝජනා** (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

**කාර්ය නිෂ්ඨාව** (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය අනුමැතිය දීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක්පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් මාරු කෙරේ.

**උපදේශනය** (විධායක කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛනකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**ව්‍යාපෘති කළමනාකරණය** (විධායක/උපදේශන ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

උපදේශන හා කොන්ත්‍රාත් ආයතන කලමනාකරණය කිරීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. රජයේ හෝ පරිත්‍යාගශීලීන්ගේ ආයතන විසින් සිදු කරනු ලබන පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන්, BOT, BOOT, සැලසුම් කිරීම හා ඉදිකිරීම් ව්‍යාපෘති අප විසින් භාරගනු ලැබේ. මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම්** (කාර්යභාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)

තත්ත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය.

**ලබාදෙන වෙනත් සේවාවන්**

අනෙක් ආයතනවල ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු, ස්ථාවර තාක්ෂණික කමිටු, අනුකමිටු සහ අනෙකුත් අදාල කමිටු සඳහා දක්ෂ තාක්ෂණික නිලධාරීන් සාමාජිකයින් ලෙස පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

තවද, ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා මිල ගණන් සාරාංශ (**BSR**) කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

අපගේ බැඳියාවන් සමඟ වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම , ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
5. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
6. මහල් නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පිළිබඳ 2018.05.25 දිනැති ගැසට් පත්‍රය අනුව සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම
7. අනෙකුත් ආයතන සඳහා තාක්ෂණ සහාය ලබාදීම
8. විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක සහ අනෙකුත් තාක්ෂණික ආයතන වල ශිෂ්‍යයන් සඳහා පුහුණු පහසුකම් සැපයීම
9. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තුල සහ අනෙකුත් බාහිර දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරුවන්ට වරලත් ඉංජිනේරු තත්වය ලබා ගැනීමට සැලසුම් කාර්යාල පුහුණු පහසුකම් සැපයීම
10. ගොඩනැගිලි ශාස්තු උපලේඛනය (**BSR)** සැකසීම හා යාවත්කාලීන කිරීම
11. **UDA** සාමාන්‍ය රෙගුලාසියට අනුව ගොඩනැගිලි තත්ත්ව වාර්තා සහතික කිරීම

## 1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. උපදේශන සේවා අංශය
   - වාස්තු විද්‍යාඥ සේවා අංශය
   - ව්‍යුහාත්මක අංශය
   - විදුලි අංශය
   - ජල සැපයුම් හා පල්දෝරු අංශය
   - යාන්ත්‍රික ඉංජිනේරු අංශය
   - ඇස්තමේන්තු අංශය
2. ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන අංශය
   - සැලසුම් අංශය
   - කලමනාකරණ සංවර්ධන අංශය
   - කොන්ත්‍රාත් අංශය
3. කලාප කාර්යාල
   - බස්නාහිර උතුර
   - බස්නාහිර දකුණ
   - කලාප 02 -යාපනය
   - කලාප 03 - කුරුණෑගල
   - කලාප 04 - මඩකලපුව
   - කලාප 05 - නුවර
   - කලාප 06 - ගාල්ල
4. පාලන අංශය
5. මුදල් අංශය
6. අභ්‍යන්තර විගණන අංශය

## 1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආයතන ප්‍රධානී, ප්‍රධාන පරිපාලන නිලධාරි/ පරිපාලන නිලධාරී විසින් අත්සන් කළ යුතු විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත අරමුණු කෙටියෙන් විස්තර කිරීම.

### 2.1 2024 දක්වා අතීත කාර්ය සාධනය




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Rehabilitation | 363.13 | 603.43 | 502.77 | 446.62 | 283.49 | 278.61 | 493.71 | 59.92 | 0.00 | 1003.04 |
| New Buildings | 1940.68 | 3313.95 | 4759.63 | 4886.74 | 4527.99 | 1672.08 | 2417.96 | 2116.12 | 1614.42 | 1689.90 |
| Total | 2303.81 | 3917.38 | 5262.40 | 5333.36 | 4811.48 | 1950.69 | 2911.67 | 2176.04 | 1614.42 | 2692.94 |

Rehabilitation    New Buildings    Total

*රූපය 3: 2024 වසර දක්වා අතීත කාර්ය සාධනය*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාව නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ලෙස වර්ග කළ හැක. වගුව 1 සහ රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය 2015 වර්ෂයේ රු. මිලියන 2303.81 සිට උච්චාවචනයන්ට ලක්වීම සිදු වූ අතර 2024 වර්ෂයේදී කාර්ය සාධනය රු. මිලියන 2692.94 විය. ඒ අනුව 2023 සිට 2024 දක්වා කාර්ය සාධනය 67% කින් වැඩි වී ඇත.

*වගුව 1: වාර්ෂික වැඩිවීම 2015-2024*

| වසර | වාර්ෂික කාර්ය සාධනය | වර්ධනය % | වර්ධනය % |
|---|---|---|---|
| | රුපියල් මිලියන | (පදනම් වර්ෂය 2015 ) | (පදනම් වර්ෂය පෙර වසර) |
| 2015 | 2303.81 | | |
| 2016 | 3917.38 | 70 | 70 |
| 2017 | 5262.40 | 128 | 34 |
| 2018 | 5333.35 | 132 | 1 |
| 2019 | 4811.48 | 109 | -10 |
| 2020 | 1950.69 | -15 | -59 |
| 2021 | 2911.67 | 26 | 49 |
| 2022 | 2176.04 | -6 | -25 |
| 2023 | 1614.42 | -30 | -26 |
| 2024 | 2692.94 | 17 | 67 |




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Annual Performance (Mn) | 2303.81 | 3917.38 | 5262.4 | 5333.35 | 4811.48 | 1950.69 | 2911.67 | 2176.04 | 1614.42 | 2692.94 |
| % Increase (Base 2013) | | 70 | 128 | 132 | 109 | -15 | 26 | -6 | -30 | 17 |
| % Increase (Base Previous Year) | | 70 | 34 | 1 | -10 | -59 | 49 | -25 | -26 | 67 |

*රූපය 4: කාර්ය සාධනයේ වර්ධනය*

2023 සිට 2024 දක්වා දෙපාර්තමේන්තුව, 1 වගුවේ පෙන්වා ඇති පරිදි, නඩත්තු, වැඩි දියුණු කිරීම් කාර්ය සාධනය රු.මිලියන 1614.42 සිට රු.මිලියන 2692.94 දක්වා වැඩි වී ඇත.

පහත වගුව 2 , නඩත්තු හා වැඩි දියුණු කිරීම් සහ නව ගොඩනැගිලිවල කාර්ය සාධනය පෙන්වයි. 2023 සිට 2024 දක්වා නව ඉදිකිරීම් කාර්ය සාධනය 9 % කින් වැඩි වූ අතර නඩත්තු හා වැඩි දියුණු කිරීම් 1592% කින් වැඩි විය. සමස්ත ප්‍රගතිය 67% වැඩි වී ඇත.

*වගුව 2: වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සංසන්දනය*

| අංශය | කාර්ය සාධනය ( රු.මිලියන) | | වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර) |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| නඩත්තු හා වැඩි දියුණු කිරීම් | 59.27 | 1003.04 | 1592% |
| නව ඉදිකිරීම් | 1555.15 | 1689.90 | 9% |
| **එකතුව** | **1614.42** | **2692.94** | **67%** |

## 2.2 2024 වසරේ ව්‍යාපෘතිවල ප්‍රගතිය




*රූපය 5- 2024 වසරේ ඉලක්ක සහ ප්‍රගතිය සංසන්දනය*

දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී ව්‍යාපෘති 210 ක් හසුරුවා ඇති අතර එයින් ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 දක්වා වූ ව්‍යාපෘති 151 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 සිට මිලියන 100 දක්වා ව්‍යාපෘති 36 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 100 සිට 200 දක්වා ව්‍යාපෘති 07 කි. ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 200 ට වඩා වැඩි ව්‍යාපෘති 16 ක් ඇත.

*වගුව 3: 2024 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය*

| කලාප කාර්යාලය | ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | **0 - 25** | **25 - 100** | **100 - 200** | **> 200** | **එකතුව** |
| බස්නාහිර/ දකුණ | 21 | 08 | 02 | 05 | **36** |
| බස්නාහිර/ උතුර | 24 | 02 | 00 | 01 | **27** |
| කලාප 2 | 12 | 02 | 01 | 01 | **16** |
| කලාප 3 | 10 | 06 | 00 | 01 | **17** |
| කලාප 4 | 60 | 05 | 01 | 01 | **67** |
| කලාප 5 | 08 | 04 | 01 | 02 | **15** |
| කලාප 6 | 16 | 09 | 02 | 05 | **32** |
| එකතුව | 151 | 36 | 07 | 16 | **210** |

තවද , අනෙකුත් ආයතන වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වූ ඇස්තමේන්තු ලබා දීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් සිදු කරනු ලැබුණි. 2024 වර්ෂය සඳහා රු.මිලියන 14,170.02 ක පමණ ඇස්තමේන්තු සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.සේවා දායක ආයතන වෙත ප්‍රතිපාදන නොලැබීම මත ඇස්තමේන්තු අනුමත නොවී තිබූ අතර අනුමත වූ පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය (වගුව 4 හි සඳහන් වේ).

*වගුව 4: 2024 වසරේදී සේවාදායකයන් සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු*

| කලාප කාර්යාලය | 2024 වසරේ ඉදිරිපත් කල ඇස්තමේන්තු | අස්තමේන්තු වටිනාකම ( රු.මිලියන) |
|---|---|---|
| කලාප 01 - බස්නාහිර දකුණ | 82 | 2,175.28 |
| කලාප 01 - බස්නාහිර උතුර | 68 | 4,569.51 |
| කලාප 02 | 42 | 734.71 |
| කලාප 03 | 20 | 926.75 |
| කලාප 04 | 80 | 1,990.61 |
| කලාප 05 | 45 | 1,406.52 |
| කලාප 06 | 69 | 2,366.64 |
| **එකතුව** | **406** | **14,170.02** |

## 2.3 උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන්හි මූලික අංශය වන්නේ උපදේශන අංශයයි. මෙම යටිතල පහසුකම් සම්බන්ධ වාස්තු විද්‍යාත්මක අංශය ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත, ව්‍යුහාත්මක, විදුලි, ජල සම්පාදන හා පල්දෝරු, යාන්ත්‍රික සැලසුම් සහ ප්‍රමාණ බිල්පත් යන ආකාරයෙන් නිර්මාණ සේවා සපයයි. ඉහත සේවාවන් සපයනු ලබන්නේ කැපවූ වෘත්තීය ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් විසිනි. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා උපදේශන අංශයේ කාර්ය සාධනය දළ සැලසුම් නිර්මාණ, සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ හා ප්‍රමාණ බිල්පත් සකස් කිරීම වශයෙන් වගුව 5 මගින් දක්වති.

*වගුව 5: උපදේශන අංශයේ කාර්ය සාධනය*

| | | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| *වාස්තුවිද්‍යා අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| දළ සැලසුම් නිර්මාණ | ඉලක්කය | 57 | 67 | 19 | 38 | 78 |
| | ප්‍රගතිය | 50 | 61 | 18 | 34 | 62 |
| සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ | ඉලක්කය | 23 | 55 | 21 | 14 | 28 |
| | ප්‍රගතිය | 12 | 40 | 14 | 12 | 24 |
| *ව්‍යුහාත්මක ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ | ඉලක්කය | 36 | 40 | 19 | 28 | 30 |
| | ප්‍රගතිය | 09 | 42 | 14 | 12 | 15 |
| *ජල සම්පාදන හා මලාපවහන ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ | ඉලක්කය | 25 | 56 | 21 | 20 | 20 |
| | ප්‍රගතිය | 17 | 52 | 18 | 14 | 20 |
| *විදුලි ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ | ඉලක්කය | 26 | 64 | 21 | 17 | 14 |
| | ප්‍රගතිය | 24 | 63 | 21 | 17 | 14 |
| *යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ | ඉලක්කය | 25 | 61 | 24 | 13 | 25 |
| | ප්‍රගතිය | 25 | 61 | 24 | 13 | 25 |
| *ඇස්තමේන්තු අංශයේ කාර්ය සාධනය* | | | | | | |
| ප්‍රමාණ බිල්පත් සකස් කිරීම | ඉලක්කය | 20 | 26 | 13 | 7 | 3 |
| | ප්‍රගතිය | 8 | 29 | 10 | 4 | 3 |
| ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තු සැකසීම - 2024 වර්ෂය | | | | | | 42 |

2024 වර්ෂයේ උපදේශන අංශයේ කාර්ය සාධනය නඩත්තු, තාක්ෂණික වාර්තා හා වෙනත් වශයෙන් වගුව 6 මගින් දක්වති.

*වගුව 6: 2024 වර්ෂයේ උපදේශන අංශයේ කාර්ය සාධනය - තාක්ෂණික වාර්තා හා වෙනත්*

| අංශය | තාක්ෂණික වාර්තා | නඩත්තු හා වෙනත් කටයුතු සඳහා සැලසුම් නිර්මාණ |
|---|---|---|
| ව්‍යුහාත්මක ඉංජිනේරු අංශය | 49 | 40 |
| ජල සම්පාදන හා පල්දෝරු අංශය | 09 | - |
| විදුලි ඉංජිනේරු අංශය | 17 | 50 |
| යාන්ත්‍රික ඉංජිනේරු අංශය | 15 | - |
| ඇස්තමේන්තු අංශය | - | - |
| **එකතුව** | **90** | **90** |

## 2.4 සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2018.05.25 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද මහල් නිවාස හිමිකාරීත්ව (විශේෂ විධි විධාන) පනතට අනුව සහාධිපත්‍ය දේපලෙහි ආරක්ෂාව සඳහා ගොඩනැගිලි සඳහා සහතික නිකුත් කිරීම සඳහා නිවාස ඒකක පරීක්ෂා කරන ලදී. 2024 වර්ෂය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද නිවාස ඒකක 468 ක් සඳහා 6 වගුවේ දක්වා ඇති පරිදි 2024 වසරේදී සහතික නිකුත් කරන ලදි.

*වගුව 6: සහාධිපත්‍ය ව්‍යාපෘති - ඉදිකල මහල් නිවාස ගණන*

| | 2024/12/31 දක්වා | 2024 වර්ෂය තුල | එකතුව |
|---|---|---|---|
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1246 | 248 | 1494 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 144 | - | 144 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 412 | 160 | 572 |
| මහ නගර සභා | 32 | - | 32 |
| නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | - | 60 | 60 |
| **එකතුව** | **-** | **468** | **-** |

# පරිච්ඡේදය 03 - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | සත්‍ය 2024 රු. | සත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,710,808,000 | 1,744,858,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 729,237,637 | 655,733,191 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 23,607,299 | 25,680,234 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,463,652,936** | **2,426,271,425** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,463,652,936** | **2,426,271,425** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **258,000,000** | **110,000,000** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **2,205,652,936** | **2,316,271,425** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 411,507,093 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 405,430,061 | 360,320,160 | ඒසීඒ-2(ii) |
| 174,046,908 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 166,310,558 | 154,946,611 | ඒසීඒ-2(ii) |
| 3,200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,686,450 | 1,857,406 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 300,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 52,500 | 128,377 | ඒසීඒ-2(ii) |
| **589,054,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **573,479,569** | **517,252,554** | |
| | **මූලධන වියදම්** | | | | |
| 13,800,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 13,746,550 | 14,879,199 | ඒසීඒ-2(ii) |
| 6,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 5,904,977 | 1,890,775 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 900,000 | හැකියා වර්ධනය | 14 | 900,000 | 834,013 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | 39,350 | ඒසීඒ-2(ii) |
| **20,700,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **20,551,527** | **17,643,337** | |
| | තැන්පතු ගෙවීම් | | 819,078,750 | 1,384,230,520 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 26,739,931 | 23,994,736 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **845,818,681** | **1,408,225,256** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,439,849,777** | **1,943,121,147** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **765,803,159** | **373,150,278** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශය අනුව ශේෂය** | | 764,038,537 | 373,150,278 | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,764,622 | - | ඒසීඒ-3 |
| | | 1 | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | තතාා 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 872,812,849 | 849,295,652 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 67,002,513 | 63,869,881 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **939,815,362** | **913,165,533** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (486,042,816) | (577,251,939) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 872,812,849 | 849,295,652 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | - | - |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 551,280,707 | 641,121,820 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 1,764,622 | - |
| මුළු වගකීම් | | **939,815,362** | **913,165,533** |

පිටු අංක **01** සිට **33** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **34** සිට **66** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025/02/26 | දිනය : 24.02.2025 | දිනය : 2025.02.24 |
| රංජිත් ආරියරත්න<br>ලේකම්<br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br>12වන මහල, "සෙත්සිරිපාය" (අදියර II), බත්තරමුල්ල. | ඉංජි.කේ.පී. සන්ධ්‍යා කුමුදිනී<br>ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>"සෙත්සිරිපාය" 2<br>බත්තරමුල්ල | කේ. කේ. අනිල් කන්නන්ගර<br>ප්‍රධාන ගණකාධිකාරී<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>"සෙත්සිරිපාය"<br>බත්තරමුල්ල |

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

[illegible]

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | [illegible] | |
|---|---|---|
| | 2024<br>රු. | 2023<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 280,688,300 | 272,495,073 |
| අග්‍රිම ලැබීම් | 1,710,808,000 | 1,744,858,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 22,465,620 | 23,878,266 |
| තැන්පතු ලැබීම් | 729,237,637 | 655,733,192 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,743,199,557** | **2,696,964,530** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 569,621,194 | 513,030,848 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,686,450 | 1,857,406 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,045,683,687 | 646,295,305 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 258,000,000 | 110,000,000 |
| අත්තිකාරම් ගෙවීම් | 26,813,327 | 23,907,114 |
| තැන්පතු ගෙවීම් | 819,078,750 | 1,384,230,520 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,720,883,408** | **2,679,321,193** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **22,316,149** | **17,643,337** |
| | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | - | - |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| නිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 20,551,527 | 17,643,337 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **20,551,527** | **17,643,337** |
| | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | (20,551,527) | (17,643,337) |
| | | - |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **1,764,622** | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | 1,764,622 | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

### වාර්තා කිරීමේ පදනම

**1. <u>පිළියෙල කිරීම් අරමුණ</u>**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**2. <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**3. <u>මිනුම්කරණ පදනම</u>**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**4. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**5. දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගැනීම සහ මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**6. දේපළ, පිරියත සහ උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ , පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**7. මුදල් සහ මුදල් සමාන දේ**

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- ❖ යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවලදී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තා කිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.
- ❖ තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතුය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000…………….

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාල නොවේ | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ප්‍රතිපාදන (රු.) | | තත්‍ය වියදම (රු.) | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්ථන | 568,400,000.00 | 589,054,000.00 | 573,479,568.56 | 97.36% |
| ප්‍රාග්ධන | 20,700,000.00 | 20,700,000.00 | 20,551,526.74 | 99.28% |

## 3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ව්‍යාපෘති ගණන | ලැබුණු අරමුදල් **2024** **(ශුද්ධ)** | **31-12-2024** දිනට මුලු වියදම | ඉතුරු මුදල (රු.) | ප්‍රගතිය (% ලෙස) |
|---|---|---|---|---|---|---|
| 01 | මැතිවරණ කොමිසම | 07 | 27,798,015.08 | 27,798,015.08 | - | 100 |
| 02 | පොලිස් දෙපාර්තමේන්තුව | 20 | 363,153,478.05 | 363,153,478.05 | - | 100 |
| 03 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 02 | 386,117.99 | 386,117.99 | - | 100 |
| 04 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 08 | 78,225,564.61 | 78,225,564.61 | - | 100 |
| 05 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව | 01 | 592,067.19 | 592,067.19 | - | 100 |
| 06 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 11 | 85,304,316.57 | 85,304,316.57 | - | 100 |
| 07 | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | 02 | 17,487,284.25 | 17,487,284.25 | - | 100 |
| 08 | තැපැල් දෙපාර්තමේන්තුව | 03 | 71,164,000.00 | 71,164,000.00 | - | 100 |
| 09 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 32 | 303,959,134.73 | 303,959,134.73 | - | 100 |
| 10 | කෘෂි අපනයන දෙපාර්තමේන්තුව | 02 | 11,711,022.16 | 11,711,022.16 | - | 100 |
| 11 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 02 | 28,703,698.22 | 28,703,698.22 | - | 100 |
| 12 | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 07 | 5,599,124.23 | 5,599,124.23 | - | 100 |
| 13 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | 05 | 11,872,362.32 | 11,872,362.32 | - | 100 |
| 14 | සුරාබදු දෙපාර්තමේන්තුව | 01 | 6,053,016.41 | 6,053,016.41 | - | 100 |
| 15 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 01 | 8,156,000.00 | 8,156,000.00 | - | 100 |
| 16 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 01 | 3,519,054.00 | 3,519,054.00 | - | 100 |
| 17 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 | 11,775,000.00 | 11,775,000.00 | - | 100 |
| 18 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 07 | 7,753,183.59 | 7,753,183.59 | - | 100 |
| 19 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 01 | - | - | - | - |
| 20 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 01 | - | - | - | - |
| | මුළු එකතුව | **115** | **1,043,212,439.40** | **1,043,212,439.40** | - | |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 2024.12.31 දිනට (රු.) | 2024.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාවේ ශේෂය (රු.) | ගණනය කිරීමට නියමිත | ප්‍රගති වාර්තා කිරීම % ලෙස |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 121,344,330.71 | 121,344,330.71 | - | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 279,133,766.84 | 279,133,766.84 | - | 100 |
| 9153 | ඉඩම් | 465,998,355.60 | 465,998,355.60 | - | 100 |
| 9154 | අස්පෘෂ්‍යය වත්කම් | 6,236,396.22 | 6,236,396.22 | - | 100 |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 100,000.00 | 100,000.00 | - | 100 |
| 9180 | කල්බදු වත්කම් | - | - | - | - |

## 3.8 **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } සීඒර්/ඒ/බීඩී/එෆ්එස්/2024/01 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 මැයි 29 දින |

අධ්‍යක්ෂ ජනරාල්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**<u>ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.</u>**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 07.11 ඡේදය ප්‍රකාරව ඒ.සී.ඒ - 7 ආකෘතිය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතු වුවත් වෙනත් ආයතන වෙනුවෙන් එකතු කරන ලද ආදායමෙන් ආපසු ගෙවන ලද මුදල වූ රු.2,736,616 ක් ආයතනය විසින් වාර්තා කරන ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම වශයෙන් වැරදි ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

දෙපාර්තමේන්තුව සතු ඉඩම් 18 ක් හා ගොඩනැගිලි 26 ක් සඳහා තක්සේරු වටිනාකම් නොමැතිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල (ACA-6 / SA-82) පෙන්නුම් කරන ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ඌන ගණනය වී තිබුණි.

### 1.6.3 අග්‍රිම කළමනාකරණය

අග්‍රිම ගිණුම් අංක 67/24ට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ අග්‍රිම ශේෂය රු.1,764,622 ක් විය. මූල්‍ය ප්‍රකාශනයෙහි ACA-3 ආකෘතියෙහි අග්‍රිම නොපිය වීමට හේතු දක්වා නොතිබුණි.

### 1.6.4 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම.

| | ලේඛණ වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | සේවක ඇප ලේඛණය | මුදල් රෙගුලාසි 880 හි විධිවිධාන | යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | නිල නිවාස පොරොත්තු | ආයතන සංග්‍රහයේ xix | යාවත්කාලීනව පවත්වාගෙන |

ලේඛණය පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය ගොස් නොතිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට සහ

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබූ බවට

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ප්‍රතිපාදන උපයෝජනය

අයවැය ඇස්තමේන්තු පිලියෙල කිරීමේදී නිසි අධ්‍යානයකින් හා සැලැස්මකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් වැය විෂයයන් 04 ක සියයට 55 සිට සියයට 83 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව තිබුණි.

### 3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ව්‍යාපෘති ඉටු කිරීම

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 04 ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 1,282 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් ඉටු කිරීමේ ප්‍රමාදයන් පැවති අතර ඉදිකිරීම් ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

### 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයෙහි වැය විෂය අංක 309-1-1-1301 හා 309-2-2-1301 ට අදාලව පිලිවෙලින් රු. 81,270 ක් හා රු. 300,536 ක බැරකම් දක්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94(1) රෙගුලාසිය ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් නිසි අධ්‍යානයකින් හා

සැලසුමකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා වැය විෂයය අංක 309-1-1-1301 හි ඉතිරි ප්‍රතිපාදනය වූ රු. 1,527 ක් ඉක්මවා රු. 79,743 ක බැරකම් වලට එළඹ තිබුණි.

### 3.4 වියදම් කලමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි අධ්‍යානයකින් හා සැලකිල්ලකින් තොරව ඇස්තමේන්තු පිලියෙල කිරීම හේතුවෙන් වැය විෂය අංක 309-1-1-1304 හා වැය විෂය අංක 309-2-2-1703 ට අදාළව ඇස්තමේන්තු කර තිබූ පිළිවෙලින් රු. 2,000,000 ක් හා රු. 100,000 ක ප්‍රතිපාදන උපයෝගී කර නොගැනීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරිව පැවතුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි අංක 1645 | වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>8.8.1. (අ) | අසාර්ථක වූ ලංසුකරුවන් වෙත විශේෂ අඩු පාඩු පෙන්නුම් කරමින් ලංසුව අසාර්ථක වීමට බලපෑ හේතු දැනුම් දී නොතිබුණි. |
| (ඇ) | 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2016 දරන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරික්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරික්ෂාවක් කල යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන 04 කට |

අදාලව ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

### 3.6 තැන්පතු

(අ) මු.රෙ. 571(2) ප්‍රකාරව ඉකුත් වූ සියළු තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් අංක 6000-0-0-16-033 දරණ තැන්පතු ගිණුමට අදාළ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ රු. 12,140,274 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ. 571(3) ප්‍රකාරව තැන්පත් ගිණුමක අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට, රජයේ ආදායමට බැර කිරීමට හෝ නැතහොත් හැකි ඉක්මනින් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවත් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා තැන්පතු වශයෙන් 2020 සහ 2021 වර්ෂවල ලැබී තිබුණු රු.31,228,168 ක මුදලක් ඉහත පරිදි කටයුතු නොකර දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. දැක්ම හා මෙහෙවර

තාක්ෂණික වගකීම අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව, පිරිමැසුම්දායක බව, ගුණාත්මක භාවය, සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි එසේම තත්කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික, නඩත්තු කිරීම්, උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවන් සැපයීම.

#### 4.1.1 කාර්යසාධනය

මුදල් රෙගුලාසි 787 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වගකිව යුතු බවයි. මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2024 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 70 කින්ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 14 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන් හා තාක්ෂණික නිලධාරීන් 105 කින් සමන්විත කාර්ය

මණ්ඩලයක් අනුයුක්තව සිටියද කාර්යසාධනය පහත සඳහන් පරිදි දුර්වල තත්ත්වයක පැවතුණි.

(අ) **දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම.**

2018 අගෝස්තු 15 දිනැති 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි 3.(3)(1) උපවගන්තිය ප්‍රකාරව සභාධිපත්‍ය දේපළ ලියාපදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ප්‍රකාශයක් එම සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. මෙම පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු බව පනතෙහි 2 වන වගන්තිය මඟින් දක්වා තිබුණු අතර 2023 අගෝස්තු 18 දින වන විට එම කාල සීමාව අවසන් වී තිබූ අතර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මකවීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම ක්‍රියාදාමය සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගත් ඉදිකිරීම් ව්‍යාපෘති**

(i) **මන්නාරම මඩු දේවස්ථාන පරිශ්‍රයේ සංක්‍රමණ නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය**

මඩු වන්දනා සමය සඳහා පැමිණෙන බැතිමතුන් හට අඩු පිරිවැයකට නිවාස 300 ක් ඉදිකිරීම් සඳහා 2018 නොවැම්බර් 15 දින රු. මිලියන 300 ක් ඉන්දියානු රජයේ ආධාර යටතේ ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතියේ උපදේශක ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පත්කර තිබූ අතර සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ගොඩනැගිලි ඉදිකරනු ලබන භූමිය ජලය රැඳෙන මඩ සහිත භූමියක් බව නිරීක්ෂණය වූ අතර ඉදිකිරීම් කිරීමට පෙර භූමිය පරීක්ෂා කල බවට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මුල් සැලසුම ප්‍රකාරව නිවාස ඒකක 300 ක් නිවාස 12 කින් යුත් දෙමහල් ගොඩනැගිලි 25 ක් ලෙස නිම කිරීමට සැලසුම් කර තිබුණද පසුව එය තනි මහල් නිවාස ලෙස වැඩ නිම කිරීමට එකඟ වීම හේතුවෙන් මුලින් වැඩ ආරම්භ කර තිබූ නිවාස සඳහා යෙදූ අත්තිවාරම් වෙනුවෙන් අනවශ්‍ය වැය බරක් දරා තිබුණි.

- භෞතික පරීක්ෂාවේදී වැඩ බිමෙහි පස් සෝදා සකස් කරගත් වැලි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හා සිමෙන්ති ගල් සෑදීම සඳහා යොදා ගන්නා බව නිරීක්ෂණය විය. 2024 මාර්තු 09 දින යාපනය විශ්වවිද්‍යාලයේ රසායනාගාරයක් මඟින් සිදු කල පරීක්ෂාවේදී, ඉදිකිරීම් සඳහා යොදා ගන්නා කුහර සහිත සිමෙන්ති ගල් වල තිබිය

යුතු සම්පීඩන ශක්තිය නොමැති බව තහවුරු කර තිබුණි. ඒ අනුව මෙම ගල් යොදා ඉදිකිරීම් කරනු ලැබූ ගොඩනැගිලි නියමිත ප්‍රමිතියෙන් නොපවතින බව නිරීක්ෂණය විය. තවද ප්‍රාදේශීය ලේකම්ගේ මැදිහත් වීමෙන් ප්‍රමාණවත් වැලි තොග කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන බවට දන්වා තිබුණද එලෙස ලබා දුන් වැලි තොග මෙම ඉදිකිරීම් වෙනුවෙන් යොදවා ගෙන නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

- අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ හා ශ්‍රමය ප්‍රමාණවත් පරිදි සපයා නොගැනීමෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එකඟ වූ පරිදි ව්‍යාපෘතිය නිම කර දීමට නොහැකි බවට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සේවාලාභී ආයතනය වන අදාළ අමාත්‍යාංශය දැනුවත් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

- භෞතික විගණන පරීක්ෂාවේදී නිවාස 08 කින් යුත් ගොඩනැගිලි ඒකක 04 ක් ලින්ටල් මට්ටම දක්වා බිත්ති බැඳ තිබුණු අතර ඉතිරි ගොඩනැගිලිවල අත්තිවාරම් පමණක් යොදා තිබුණු බව දක්නට විය. අවබෝධතා ගිවිසුම පරිදි 2024 දෙසැම්බර් 05 විගණිත දිනය වන විටත් පූර්ණ කාලීනව යෙදවිය යුතු කාර්ය මණ්ඩලය සහ පුහුණු ශ්‍රමිකයන් වැඩ බිමට යොදවා නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23 ක් හා සියයට 47 ක් විය.

**(ii) තල් කර්මාන්තය විවිධාංගීකරණය කරමින් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට තල් ආදර්ශ ගොවිපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

තල් කර්මාන්තය විවිධාංගීකරණය කරමින් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට හා තල් ආදර්ශ ගොවිපලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තල් සංවර්ධන මණ්ඩලය උපදේශන ආයතනය ලෙස 2021 මාර්තු 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තෝරාගෙන තිබුණි.

- ව්‍යාපෘතිය ඉදිකිරීමට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව රු. 18,029,000 ක් වූ නමුත් ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීමෙහි ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 23 ක් ලෙස දක්වා තිබුණි.

- ලංසුකරුවන් දෙදෙනෙකු පමණක් ලන්සු ඉදිරිපත් කරන ලද අතර තෝරා ගනු ලැබූ ලංසුකරුගේ ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 9.58 කින් වැඩි වූ අතර නව කොන්ත්‍රාත් වටිනාකම රු. 19,756,134 ක් විය. 2021 නොවැම්බර් 23 දෙපාර්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරු අතර ගිවිසුම් අත්සන් කර තිබුණද ප්‍රතිග්‍රහණ ලිපිය අනුව ගිවිසුම් අත්සන් කිරීමට පෙර කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.

- 2021 ජුලි 26 දින ප්‍රධාන ඉංජිනේරු කලාප අංක 06 විසින් අධ්‍යක්ෂ (ඉංජිනේරු සැලසුම්) වෙතින් වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විද්‍යුත් සහ ජල සැපයුම් සඳහා සැලසුම් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණත් 2021 නොවැම්බර් 03 දින වන විටත් අදාළ සැලසුම් ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර නොතිබුණි.

- 2022 ජුලි 12 දින සිට කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය ඉදිකිරීම් අතහැර තිබූ අතර 2022 අගෝස්තු 15 දින වන විට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 30 ක් බව කලාප අංක 06 හි ප්‍රධාන ඉංජිනේරු විසින් වාර්තා කර තිබුණි. ඒ වන විට ව්‍යාපෘතියේ සහතික කල වැඩ වටිනාකම රු. 4,964,868 ක් ව තිබූ බවත් නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තුවන බව අංක 2-3-14-382 හා 2022 ඔක්තෝබර් 19 දිනැති ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ට දන්වා තිබුණ ද 2024 සැප්තැම්බර් 02 දින දක්වාම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

- ව්‍යාපෘතිය ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ මුදලින් 2022 සැප්තැම්බර් 30 දින වන විට අත ඉතිරි මුදල් ලෙස රු. 12,677,762 ක මුදලක් පැවති අතර මෙම මුදල් විගණිත දිනය වූ 2024 සැප්තැම්බර් 02 දින දක්වාම දෙපාර්තමේන්තු තැන්පත් ගිණුමෙහි රඳවා තිබුණි.

**(iii) කොළඹ නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

කැබිනට් පත්‍රිකා අංක 16/1676/702/003-XXVII සහ 2016 අගෝස්තු 18 දිනැති කැබිනට් තීරණ අංක 10/08/2016/10 මගින් ශ්‍රී ලංකා පොලිසියේ ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිවලින් කොටසක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පැවරීම යටතේ නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීමේ මුළු ඇස්තමේන්තු පිරිවැය රු.376,587,327 ක් වූ ව්‍යාපෘතියෙහි කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි. ඒ අනුව ජාතික තරඟකාරී ලංසුකැඳවීමේ ක්‍රමය මත මෙහි ප්‍රසම්පාදන කටයුතු සිදු කොට තිබුණු අතර එක් කොන්ත්‍රාත් ආයතනයක් පමණක් රු. 416,589,070 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- 2017 මාර්තු මාසයේ කොන්ත්‍රාත්කරු සමඟ ප්‍රසම්පාදන කමිටු සාකච්ඡා පවත්වා තිබුණු අතර ලංසු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායකයක් ලෙස C2 ශ්‍රේණිය හෝ ඊට ඉහළ සුදුසුකමක් වූ අතර එය කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදීත් වලංගු විය යුතු බවට සඳහන් කොට තිබුණද කොන්ත්‍රාත්කරු සතුව CS2 ශ්‍රේණිය 2017 පෙබරවාරි 18 දක්වා පමණක් වලංගුව බවට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි සඳහන් කොට තිබුණි. මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ

ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අවම සුදුසුකම් සපුරා නොතිබුණු ඉහත කොන්ත්‍රාත්කරු වෙත රු.388,587,320 කොන්ත්‍රාත් වටිනාකමකට 2017 සැප්තැම්බර් 15 දින පිරිනැමීමට නිර්දේශ කර තිබුණි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 අනුව සමාන කොන්ත්‍රාත් පිළිබඳව ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ අතීත කාර්යසාධනය, මූල්‍ය සම්පත් සහ ගිවිසුම සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා ලංසුකරුවන් වෙත ඇති හැකියාව සහ සම්පත් පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ උපමාන ලෙස දක්වා ඇතත් මෙම ලංසුඇගයුම් ක්‍රියාවලියේදී ඒ පිළිබඳව සැලකිල්ලට ගත් බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවිය.

- 2020 පෙබරවාරි 20 දිනැති ප්‍රධාන ඉංජිනේරු බස්නාහිර දකුණ විසින් උපදේශක ඇමතූ ලිපිය අනුව, slab, beams, columns, lift wall සඳහා අනුමැතියකින් තොරවූ වෙනත් වර්ගයකින් steel bars යොදා ගෙන තිබූ අතර ඒ වන විටත් හත්වන මහලෙහි කොන්ක්‍රීට් වැඩ අවසන් කොට තිබුණි. වැඩ කිරීම සඳහා සපයා ගෙන තිබුණු අනුමැතිය ලද ගුණාත්මක තත්ත්වයේ 25mm bars ද විබාදනය වූ පරණ තොගයක් බවට සඳහන් කර තිබුණි. අනුමැතියකින් තොර යකඩ කම්බි භාවිතා කර ඉදිකිරීම් කරනු ලබන ගොඩනැගිල්ලෙහි ප්‍රමිතිය හා පැවැත්ම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

- කොන්ත්‍රාත් සමාගමේ හවුල්කාර විදේශ ආයතනය ඉවත් වීම සහ කොන්ත්‍රාත් ආයතනය බුන්වත් වීම හේතු කොටගෙන කොන්ත්‍රාත්තුව අවලංගු වූ අතර ඒ වන විට භෞතික ප්‍රගතිය සියයට 46 ක් පමණි.

### 4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කලමනාරණ පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කල යුතු බවත්, 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10(02) ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(02) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 වත්කම් කළමනාකරණය

(අ) නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩමේ කොටසක් අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබුණු අතර එම ඉඩම මැනුම් කටයුතු සිදුකර හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු දියතලාව ඉඩම ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇති අතර ඒ වෙනුවට හපුතලේ ඉඹබන් ආර ප්‍රදේශයේ ඉඩමක් ලබාදීමට නියමිත බව දැන්වූවත් ඔප්පු ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

### (අ) රජයේ නිලධාරින්ගේ හිඟ අත්තිකාරම් ශේෂ

i. 2017 සහ 2022 වර්ෂ වලදී විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු. 115,861 ක් හා රු. 151,215 ක ණය ශේෂයක් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

ii. 2023 වර්ෂයේදී වැඩ තහනමට ලක්ව තිබූ නිලධාරියෙකුගෙන් රු. 330,234 ක ණය ශේෂයක් අයකර ගැනීමට පැවතුණද එම ණය ශේෂය අය කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

iii. 2022 සහ 2023 යන වර්ෂ වල සේවය අතහැර ගොස් තිබූ නිලධාරියෙකුගෙන් රු. 121,439 ක ණය ශේෂයක් අයකර ගැනීමට පැවතුණද එම ශේෂය මෙතෙක් ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීම්කර තිබූ වටිනාකම රු. මිලියන 30.4 ක වාහන 04 ක් කල්බදු කාලය අවසන් වී පැවතුණද දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධනය පිලිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුලදී 2030 වර්ෂය වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති කොටස ඉහළ නැංවීම අරමුණු කරගෙන අලුතෙන් ඉදිකරනු ලබන හා නවීකරණය කරන රජයේ සියළුම ගොඩනැගිලි සූර්යය බලය උපයෝගී කර පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරන පහසුකම් වලින් සමන්විතව ඒවායන්හි බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 25 ක් සපුරා ගැනීම ඉලක්ක කර තිබුණි.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා වන පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බලය උපයෝගී කර ගැනීම හා එමඟින් යෝජිත ගොඩනැගිල්ලේ බලශක්ති අවශ්‍යතාවයෙන් කොටසක් සපුරා ගැනීම පිළිබඳව සේවාදායක ආයතනය දැනුවත් කිරීම.

(ආ) සූර්ය පැනල ස්ථාපිත කිරීමේ පහසුව හා ඉඩකඩ පුළුල් කිරීම, මූලික ගොඩනැගිලි සැලසුමෙහි අනිවාර්ය අංගයක් ලෙස නිර්ණායක සැකසීම.

(ඇ) රජයේ සියළුම ගොඩනැගිලි වල බල ශක්ති අවශ්‍යතාවයෙන් යම් පංගුවක් සූර්යය බලය උපයෝගී කරගෙන සපුරා ගත යුතු බවට නීති රෙගුලාසි පැනවීමට මූලිකවම දායක වීම.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය, කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | ඌනතාවය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 126 | 97 | 29 |
| තෘතියික | 24 | 03 | 21 |
| ද්විතියික | 309 | 249 | 60 |
| ප්‍රාථමික | 178 | 134 | 44 |
| **එකතුව** | **637** | **483** | **154** |

තනතුරු 154 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

Jabeysegh

එච්.ජේ.ඩී. චාන්දනී අබේසිංහ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති (වැ.බ) වෙනුවට

## පරිච්ඡේදය 04 — කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%- 90% | 75%- 89% | 50%- 74% | 50 % ට වඩා අඩු |
| දළ රූප සටහන් නිර්මාණ | | 76.6% | | |
| සැලසුම් සටහන් නිර්මාණය | | 83.3% | | |
| සම්පූර්ණ කල ව්‍යාපෘති (ව්‍යාපෘති ගණන) | 92% | | | |
| සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (ඉදිකිරීම්) | | 77% | | |
| සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (නඩත්තු) | 100% | | | |
| සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව (ව්‍යාපෘති කළමනාකරණය) | | | 72% | |

**පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

| | අරමුණු | ඉලක්ක | දර්ශකය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | 2024 වර්ෂ සේවාදායක ආයතන 05 කට වහලේ වර්ග ප්‍රමාණය (Roof area) අනුව සූර්ය පැනල සඳහා පිරිවිතර හා දළ ඇස්තමේන්තු සකස් කර දීම - SDG 07 | සූර්ය බලය උපයෝගී කරගෙන පුනර්ජනනීය බලශක්තිය නිපදවීම මගින් විදුලි ඉල්ලුම අඩුකිරීම | ඉල්ලීම් කරන ලද සේවාදායක ආයතනය සඳහා සූර්ය පැනල සවි කිරීම | 1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හෝමාගම**<br>ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කරන ලදී. සේවාදායකයා විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ. ලියකියවිලි ලබා දී ඇත.<br><br>**2. තැපැල් ගොඩනැගිල්ල, පොළොන්නරුව**<br>ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කරන ලදී. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (CEZ4) විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.<br><br>**3. අම්පාර මහ රෝහලේ සංචාරක බංගලාව**<br>ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කරන ලදී. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (CEZ4) විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.<br><br>**4. අධිකරණ සංකීර්ණය, තෙල්දෙණිය**<br>ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කරන ලදී. ඇස්තමේන්තුව අනුමත කර නැත.<br><br>**5. ශ්‍රී ලංකා තහනම් උත්තේජක විරෝධී ඒජන්සිය**<br>ඉංජිනේරු ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත. ඇස්තමේන්තුව අනුමත කර නැත. |

## පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවකයන් සංඛ්‍යාව | කොන්ත්‍රාත්/අනියම් | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 126 | 97 | 0 | 29 |
| තෘතියික | 24 | 3 | 0 | 21 |
| ද්විතියික | 309 | 249 | 0 | 60 |
| ප්‍රාථමික | 178 | 134 | 3 | 44 |
| **මුළු එකතුව** | **637** | **483** | **3** | **154** |

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න.

- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් පුළුල් කාර්යය භාරයක් ඉටු කරන දෙපාර්තමේන්තුවක් වන අතර වර්තමානයේදී රජයේ ගොඩනැගිලි බොහොමයක නඩත්තු කටයුතු ද ඉටු කරනු ලබයි.
- එහිදී අවශ්‍ය වන තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමේදී බාධක මතුවේ.
- 2024/12/31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වන 637 න් සේවයේ නියුක්තව ඇත්තේ 486 ක් පමණි.
- අත්‍යාවශ්‍ය තාක්ෂණික ගණයේ තනතුරු හෝ පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය හා අනුයුක්ත කිරීම් ලැබුනේ නම් ව්‍යාපෘති කටයුතු මීට වඩා කාර්යක්ෂමව ඉටුකිරීමේ හැකියාව පැවතුනි.

## 6.3 මානව සම්පත් කළමනාකරණය

| අංකය | වැඩසටහන හෝ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | කුසලතා/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීමේ වැඩසටහන- පුහුණුවීම් සඳහා පර්යේෂණ | 01 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 2 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු Msc. ඩිප්ලෝමා වැඩසටහන 2023/2024 | 01 | වසර 02 | 200,000.00 | | දේශීය | |
| 3 | ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන | 01 | වසර 02 | 50,000.00 | | දේශීය | |
| 4 | ව්‍යාපෘති කළමනාකරණ වෘත්තීය (PMP) සහතිකය පිළිබඳ CPD පාඨමාලාව - දැනුම බෙදාගැනීම අංකය.02 | 13 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 5 | ගොඩනැගිලිවල සිරස් ප්‍රවාහන පද්ධති (VTS)-2024 CPD පාඨමාලාව | 01 | දින 13 | 23,500.00 | | දේශීය | |
| 6 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ Msc. වැඩසටහන | 01 | වසර 01 | 204,900.00 | | දේශීය | |
| 7 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ අසාත්මිකතා ප්‍රතිශක්තිකරණ හා සෛල ජීව විද්‍යා ඒකකය පිහිටුවීම | 05 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 8 | ඩෙස්ක්ටොප් දත්ත කළමනාකරණය (MS Access) පිළිබඳ වැඩමුළුව | 02 | දින 02 | 26,000.00 | | දේශීය | |
| 9 | රජයෙන් රජයට (G2G) හුවමාරු සහ ශ්‍රී ලංකාවේ ජල පරිසරය වැඩිදියුණු කිරීම පිළිබඳ ජපන් ජොකාසු සම්මන්ත්‍රණය | 04 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 10 | AutoCAD භාවිතයෙන් පරිගණක ආධාරක ඇඳීම් සහ ත්‍රිමාණ ආකෘති නිර්මාණය පිළිබඳ පුහුණු පාඨමාලාව | 01 | දින 12 | 30,000.00 | | දේශීය | |
| 11 | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය(IESL) විසින් සංවිධානය කරන ලද 2004 ජාතික ඉංජිනේරු සම්මන්ත්‍රණය | 05 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 12 | ඉදිකිරීම් කර්මාන්තයේ කොන්ත්‍රාත්කරුවන් කාර්යයේ මිල උච්චාවචනය | 09 | දින 01 | 36,000.00 | | දේශීය | |
| 13 | තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 14 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |

| අංකය | වැඩසටහන හෝ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | හිමිවූම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 14 | ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණයේ මූලික කරුණු පිළිබඳ එක් දින සම්මන්ත්‍රණය | 06 | දින 01 | 30,000.00 | | දේශීය | |
| 15 | පරිපාලන නිලධාරි ධාරිතා සංවර්ධනය | 01 | දින 03 | 15,000.00 | | දේශීය | |
| 16 | කාර්යාල සහකාරවරුන්ගේ යුතුකම් සහ වගකීම් | 02 | දින 02 | 26,000.00 | | දේශීය | |
| 17 | සමීක්ෂණ මණ්ඩලය, පාඩු සහ කපා හැරීම් | 01 | දින 02 | 13,000.00 | | දේශීය | |
| 18 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත රැකියා ස්ථානයේ නිලධාරීන් දැනුවත් කිරීම | 04 | දින 01 | මුදල් නොගෙවන පාඨමාලාවකි | | දේශීය | |
| 19 | ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නීතිය සහ ආරවුල් විසඳීමේ පරිචය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය | 05 | දින 01 | 25,000.00 | | දේශීය | |
| 20 | තොරතුරු දැනගැනීමේ අයිතිය වැඩසටහන | 08 | දින 01 | 20,000.00 | | දේශීය | |
| 21 | වැඩ ඵලදායිතාව සඳහා Google Apps සහ AI මෙවලම් පිළිබඳ වැඩමුළුව | 04 | දින 01 | 30,000.00 | | දේශීය | |
| 22 | කොන්ක්‍රීට් මිශ්‍රණ නිර්මාණ | 01 | දින 02 | 25,000.00 | | දේශීය | |
| 23 | CPD පාඨමාලාව " සෞඛ්‍ය ආරක්ෂණ යෙදුම් සඳහා විශේෂිත HVAC නිර්මාණ -2024" | 01 | දින 02 | 10,600.00 | | දේශීය | |
| 24 | ඉදිකිරීම් ආරක්ෂාව පිළිබඳ එක් දින සම්මන්ත්‍රණය | 02 | දින 01 | 10,000.00 | | දේශීය | |
| 25 | ඉදිකිරීම් නීතිය සහ ආරවුල් විසඳීම පිළිබඳ Msc. වැඩසටහන | 01 | වසර 01 | 125,000.00 | | දේශීය | |
| 26 | වානේ වහල ඉදිකිරීම පිළිබඳ තාක්ෂණික සම්මන්ත්‍රණය | 44 | දින 01 | - | | දේශීය | |
| 27 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 21 | පැය 70 | 52,500.00 | | දේශීය | |
| 28 | නවෝත්පාදනය සහ පූර්ව ලියාපදිංචි තක්සේරු කිරීම තුළින් ආර්ථික විද්‍යාව සංවර්ධනය කිරීමේ ආරම්භක ව්‍යාපාර ප්‍රවර්ධනය ඉන්දියානු වැඩසටහන | 01 | දින 20 | - | | විදේශීය | |

| අංකය | වැඩසටහන හෝ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | හිමිකම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 29 | 2024 වසර සඳහා ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා (ITEC) ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ පුහුණු ස්ථාන (මාර්ගගතව - කෙටි කාලීන) | 01 | දින 13 | - | | විදේශීය | |
| 30 | ජනාවාස III සන්දර්භය තුළ ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම ඉන්දියාවේ නව නාගරික න්‍යාය පත්‍රය ප්‍රතිපත්ති, සැලසුම් සහ ප්‍රායෝගික වැඩසටහන | 01 | දින 19 | - | | විදේශීය | |

**මානව සම්පත් කළමනාකරණය සාරාංශයක් ලෙස.**

| සේවා කාණ්ඩය | සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජනය (රු.) | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| ඉංජිනේරු | 77 | 494,600.00 | - |
| පරිපාලන | 1 | - | - |
| අභ්‍යන්තර විගණන | 1 | - | - |
| වාස්තු විද්‍යා | 11 | 204,900.00 | - |
| සැලසුම් ශිල්පී (තාක්ෂණික) | 10 | 30,000.00 | - |
| පරිපාලන නිලධාරී ( විශේෂ) | 1 | 15,000.00 | - |
| තාක්ෂණ නිලධාරී (තාක්ෂණික) | 28 | 67,500.00 | - |
| සංවර්ධන නිලධාරී | 4 | 39,000.00 | - |
| කළමනාකරණ සේවා නිලධාරී | 4 | - | - |
| ප්‍රාථමික ශිල්පීය නොවන | 23 | 78,500.00 | - |
| ප්‍රමාණ සමීක්ෂණ (තාක්ෂණික) | 2 | 23,000.00 | - |

## 07- පරිච්ඡේදය— අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලතා දක්වයි | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලතා දක්වයි | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් මුදල් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් මුදල් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA –N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූලතා දක්වයි | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 3.3 | සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම | අනුකූලතා දක්වයි | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූලතා දක්වයි | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනයට ඉදිරිපත් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූලතා දක්වයි | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූලතා දක්වයි | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූලතා දක්වයි | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූලතා දක්වයි | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූලතා දක්වයි | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | අනුකූලතා දක්වයි | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූලතා දක්වයි | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූලතා දක්වයි | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලතා දක්වයි | | |
| 9.2 | වාහන ගර්හාත වී මාස 06 කට අඩු කාලයකදී අපහරණය කර තිබීම | අදාල නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලතා දක්වයි | | |
| 9.5 | 2016.12.29 දිනැති 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලතා දක්වයි | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූලතා දක්වයි | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදි හො ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලතා දක්වයි | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලතා දක්වයි | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලතා දක්වයි | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12. I | සීමාවන්ට වලට අනුකූල වීම | අනුකූලතා දක්වයි | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූලතා දක්වයි | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13. 1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වි මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූලතා දක්වයි | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලතා දක්වයි | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූලතා නොදක්වයි | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූලතා දක්වයි | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරුතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලතා දක්වයි | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලතා දක්වයි | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හො වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාක්මක කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් පදනම් කරගෙන මානව සමපත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලතා දක්වයි | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | පුහුණු වියදම් ශීර්ෂය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලතා දක්වයි | | |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූලතා දක්වයි | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූලතා දක්වයි | | |

*අවසානය*